රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක : 02/2014

මගේ අංකය : HAF-1/04/N/01
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07
2014.03.12 දින

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
දිස්ත්‍රික් ලේකම්වරුන්/දිසාපතිවරුන්
ප්‍රාදේශීය ලේකම්වරුන්

**<u>නොතාරිස් ධූරයේ කටයුතු කිරීම</u>**

ආයතන සංග්‍රහයේ XXX පරිච්ඡේදයේ 1:4 උප වගන්තිය කෙරෙහි අවධානය යොමු කරවමි.

02. එහි විධිවිධාන අනුව දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන සේවයේ නියුතු නිලධරයන්ට රාජකාරී වේලාවෙන් පරිබාහිරව නොතාරිස් ධූරයේ කටයුතු කිරීම සඳහා මවිසින් අනුමැතිය ලබා දී ඇත.

03. මෙම නිලධරයන්ගේ රාජකාරී විෂය පථයට ඉඩම් සම්බන්ධ කටයුතු අයත්වන බැවින් නොතාරිස් කටයුතු කිරීම යෝග්‍ය නොවන බවට මා වෙත විවිධ නියෝජනයන් ඉදිරිපත් වී ඇත. එබැවින් මෙම චක්‍රලේඛය නිකුත් කළ දිනයේ සිට දිස්ත්‍රික් හා ප්‍රාදේශීය පරිපාලන සේවයේ නියුතු නිලධරයන් නොතාරිස් ධූරයේ කටයුතු කිරීම නොකළ යුතුය.

04. ඒ අනුව දිස්ත්‍රික් පරිපාලනයේ හා ප්‍රාදේශීය පරිපාලනයේ නියුතු නිලධරයන්ට එම තනතුරුවල අඛණ්ඩව රැදී සිටීමට අවශ්‍ය වන්නේනම් තනතුරු දරමින් නොතාරිස් ධූරයේ කටයුතු කිරීම නොකළ යුතු අතර, නොතාරිස් ධූරයේ අඛණ්ඩව කටයුතු කිරීමට අවශ්‍ය වන්නේනම් දිස්ත්‍රික්/ ප්‍රාදේශීය පරිපාලන කටයුතුවලින් ඉවත්ව වෙනත් සේවා ස්ථානයකට ස්ථාන මාරුවක් ලබා ගැනීම සුදුසු බවට අවධාරණය කරමි.

05. දැනටමත් ඉඩම් සම්බන්ධ රාජකාරී කටයුතු කරන නිලධරයන්ට, තම රාජකාරී කොට්ඨාසයෙන් බැහැරව, රාජකාරී වේලාවෙන් පසුව, රාජකාරියට බාධාවක් නොවන පරිදි නොතාරිස් ධූරයේ කටයුතු කිරීමට ලබාදී ඇති අවසරය මෙම චක්‍රලේඛය නිකුත් කරන දින සිට අවලංගු වන අතර, ඉඩම් සම්බන්ධ රාජකාරී කටයුතු සිදු නොකරන එහෙත් ඉහත අවසරය ලබාදී ඇති නිලධරයන් ඉඩම් සම්බන්ධ රාජකාරී කටයුතු සිදු කරන තනතුරකට පත්වීමක් ලදහොත් නොතාරිස් ධූරයේ කටයුතු කිරීම සිදු නොකළ යුතු අතර ඒ බව මෙම අමාත්‍යාංශයට/ අදාල අමාත්‍යාංශයේ ලේකම්වරයාට ද දැන්විය යුතු වේ.

පී.බී.අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය